# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2015 ජූනි මස 12 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2015.06.15 දින නිකුත් කරන ලදී)**


# විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 18.00 යි. තැපැල් ගාස්තුව : රු. 15.00 යි.

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
සංශෝධනය

එල්.ඩී.—ඕ. 24/2015

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය.

**1.** මේ පනත විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 62 වන ව්‍යවස්ථාව එකී ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ—

> "(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන මන්ත්‍රීවරයන් දෙසීය තිස් හතකගෙන් සමන්විත පාර්ලිමේන්තුවක් වන්නේ ය.".

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව ප්‍රතියෝජනය කිරීම.

**3.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ :-

"සීමා නිර්ණය කොමිෂන් සභාව පිහිටුවීම.

> **95.** (1) (අ) ජනාධිපතිවරයා විසින් සෑම වසර පහළොවකට වරක් සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු අතර මෙම ව්‍යවස්ථාව බලාත්මක වීමෙන් මාස තුනක් ඇතුළත, ජනාධිපතිවරයා විසින් මැතිවරණ කොට්ඨාස සහ ඡන්ද ප්‍රදේශ සීමා නිර්ණය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත තමන් විසින් පත් කරනු ලබන තැනැත්තන් පස් දෙනෙකුගෙන් සමන්විත එවැනි ප්‍රථම යථායෝග්‍ය සීමා නිර්ණය කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබිය යුත්තේ ය.
>
> (ආ) දේශපාලන කටයුතුවල නිරතව නොසිටින්නා වූ බවට ජනාධිපතිවරයා විසින් සෑහීමට

2—PL 009100—400 (2015/06)

පත්වන්නා වූ තැනැත්තන් අතුරින් සීමා නිර්ණය කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කරනු ලැබිය යුත්තේ ය.

(ඇ) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත එම සාමාජිකයන්ගෙන් එක් අයකු එහි සභාපතිවරයා වශයෙන් පත්කරනු ලැබිය යුත්තේ ය.

(2) සීමා නිර්ණය කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු මිය ගියහොත් නැත්නම් ඉල්ලා අස්වුවහොත් එසේත් නැත්නම් එවැනි යම් සාමාජිකයකුට ඒ කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් සිය කර්තව්‍ය ඉටු කළ නොහැකි බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත ජනාධිපතිවරයා සෑහීමට පත්වන්නේ නම්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, ජනාධිපතිවරයා විසින්, ඒ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුත්තේ ය.

(3) සීමා නිර්ණය කොමිෂන් සභාව වෙත, එහි කර්තව්‍ය ඉටු කිරීමේ දී සහාය වීමේ කාර්යය සඳහා ජනාධිපතිවරයා විසින්, එම කොමිෂන් සභාවට ලේකම්වරයෙකු ද, අවශ්‍ය අවස්ථාවන්හි දී අතිරේක ලේකම්වරයෙකු, නියෝජ්‍ය ලේකම්වරයෙකු සහ සහකාර ලේකම්වරයෙකු ද පත් කරනු ලැබිය යුත්තේ ය.

(4) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින්, එහි කර්තව්‍ය ඉටු කිරීමේ දී අවශ්‍ය යයි සළකනු ලබන්නේ නම්, එම කොමිෂන් සභාවට සහාය වීම පිණිස එහි කාර්ය මණ්ඩලය වශයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ හෝ මැතිවරණ දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක යම් නිලධරයකු හෝ අනුයුක්ත කරනු ලැබිය හැක්කේ ය.”.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96 වන ව්‍යවස්ථාව සංශෝධනය කිරීම.

**4.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96 වන ව්‍යවස්ථාව, එහි (6) වන අනුව්‍යවස්ථාව ඉවත් කිරීම මගින් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 96අ අලුත් ව්‍යවස්ථාව ඇතුළත් කිරීම.

**5.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 96 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථාව මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එහි 96අ ව්‍යවස්ථාව ලෙස බලාත්මක විය යුතු ය :-

"මැතිවරණ කොට්ඨාස ඡන්ද ප්‍රදේශවලට බෙදීම.

96අ. (1) මැතිවරණ කොට්ඨාස ඡන්ද ප්‍රදේශවලට බෙදීමේ දී සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන සාධක සැලකිල්ලට ගත යුතුය :-

(අ) යම් මැතිවරණ කොට්ඨාසයක් තුළ ඇති යම් ප්‍රදේශයක ජාතික, ආගමික හෝ අන්‍යාකාරයෙන් වූ ජනවාර්ගික බැඳියාවන් සහිත එහෙත් එම කරුණු එකක් හෝ වැඩි ගණනක් සම්බන්ධයෙන් එම ප්‍රදේශයේ පදිංචිකරුවන්ගේ බහුතරයෙන් වෙනස් වන සැලකිය යුතු ජන ප්‍රජාවක් ඒකරාශී වී සිටින බව සීමා නිර්ණය කොමිෂන් සභාවට පෙනී යන අවස්ථාවක එම කොමිෂන් සභාව විසින් අවශ්‍ය විය හැකි පරිදි එම බැඳියාවන් නියෝජනය කළ හැකි වන අයුරින් එකී මැතිවරණ කොට්ඨාසය, ඡන්ද ප්‍රදේශවලට බෙදීම සිදු කරනු ලැබිය හැක්කේ ය.

(ආ) එවැනි බෙදීමක් සිදුකිරීමේ දී, කොමිෂන් සභාව විසින් —

(i) මැතිවරණ කොට්ඨාස තුළ ඇති විවිධ ඡන්ද ප්‍රදේශවල වාසය කරන තැනැත්තන්ගේ සංඛ්‍යාව සමානුපාත නොවීම අවම කිරීමේ අභිලාෂය;

(ii) ඡන්ද ප්‍රදේශවල භූගෝලීය සහ භෞතික ලක්ෂණ; සහ

(iii) මැතිවරණ කොට්ඨාසයේ හෝ ඡන්ද ප්‍රදේශයේ ආර්ථික සංවර්ධනයෙහි මට්ටම සහ පවත්නා සංස්කෘතික බැඳීම්,

නිසි සැලකිල්ලට ගත යුත්තේ ය.

(2) (අ) (i) (1) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති සාධක සැලකිල්ලට ගැනීමේ දී පසු මන්ත්‍රීවරයන් එක් අයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති බහු මන්ත්‍රී ඡන්ද ප්‍රදේශ පිහිටුවීම උචිත බව; හෝ

(ii) යම් මැතිවරණ කොට්ඨාසයක් තුළ ඇති ඡන්ද ප්‍රදේශ සංඛ්‍යාව ඉහළ යාම වැළැක්වීම පිණිස, එක් මන්ත්‍රීවරයෙකුට වඩා වැඩි සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති බහු මන්ත්‍රී ඡන්ද ප්‍රදේශ පිහිටුවීම උචිත බව; හෝ

(iii) අතීතයේ දී බහු මන්ත්‍රී ආසන පිහිටුවීම සඳහා තුඩු දුන් හේතු තවමත් වලංගු සහ අදාළ වන බව, සීමා නිර්ණය කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, බහු මන්ත්‍රී ඡන්ද ප්‍රදේශයක් හෝ බහු මන්ත්‍රී ඡන්ද ප්‍රදේශ හෝ පිහිටුවීම සඳහා එම කොමිෂන් සභාවට බලය ඇත්තේ ය :

කෙසේ වුව ද, බහු මන්ත්‍රී කොට්ඨාසයකින් සෘජුව පත් කර ගත යුතු මන්ත්‍රී ධුර සංඛ්‍යාවේ උපරිමය කවර හෝ අවස්ථාවක තුනක් නොඉක්මවිය යුතු ය.

(ආ) කෙසේ වුව ද, පිහිටුවනු ලබන බහු මන්ත්‍රී ඡන්ද ප්‍රදේශ සංඛ්‍යාව අවමයක පවත්වාගෙන යනු ලබන බවට සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් සහතික විය යුත්තේ ය.

**6.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97, 98, 99 සහ 99අ ව්‍යවස්ථා මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ආදේශ කරනු ලැබේ :-

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 97, 98, 99 සහ 99අ ව්‍යවස්ථා ප්‍රතියෝජනය කිරීම.

"මැතිවරණ කොට්ඨාස සහ ඡන්ද ප්‍රදේශවල නම් ආදිය ප්‍රකාශයට පත් කිරීම.

**97.** (1) සීමා නිර්ණය කොමිෂන් සභාව විසින්, ජනාධිපතිවරයා විසින් නිශ්චය කරනු ලබන අවස්ථාවෝචිත පරිදි කාලපරිච්ඡේදයක් තුළ දී හෝ දීර්ඝ කරනු ලබන කාලපරිච්ඡේදයන් තුළ දී සිය අධිකාරී බලය ඉටු කිරීම කළ යුතු අතර, එසේ සිය අධිකාරී බලය ඉටු කළ පසු ඒ පිළිබඳ හේතු ඇතුළත්, ඒ සමඟ එකඟ නොවන සාමාජිකයන් ඇත්නම් ඒ සම්බන්ධ ඔවුන්ගේ හේතු ද සමඟ ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) (1) වන අනුව්‍යවස්ථාව යටතේ සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තාව ලැබීමේ දී ජනාධිපතිවරයා විසින්, මැතිවරණ කොට්ඨාසවල නම් සහ සීමාවන් ද එම එක් එක් මැතිවරණ කොට්ඨාස තුළට ගැනෙන ඡන්ද ප්‍රදේශවල නම් සහ සීමාවන් සහ එක් එක් මැතිවරණ කොට්ඨාසය සහ ඡන්ද ප්‍රදේශවලට තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම් ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ද ප්‍රකාශනයක් මගින් ප්‍රසිද්ධ කළ යුත්තේ ය.

(3) (2) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද ප්‍රකාශනයේ නිශ්චිතව දක්වා ඇති මැතිවරණ කොට්ඨාස සහ ඡන්ද ප්‍රදේශ එම ප්‍රකාශනය ප්‍රසිද්ධ කිරීමෙන් පසු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන සියලු මැතිවරණ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතු අතර, ඉන්පසුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සියලු කාර්ය සම්බන්ධයෙන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමට අදාළව තත් කාලයේ බලපවත්නා යම් නීතියක් සම්බන්ධයෙන් මැතිවරණ කොට්ඨාස සහ ඡන්ද ප්‍රදේශ විය යුත්තේ ය.

මැතිවරණ කොට්ඨාස අතර මන්ත්‍රීවරයන් බෙදා වෙන් කිරීම.

**98.** (1) යම් මැතිවරණ කොට්ඨාසයක් තුළ ඇති සියලු ඡන්ද ප්‍රදේශ සෘජුව නියෝජනය කිරීම සඳහා මෙම ව්‍යවස්ථාවේ ඉක්බිතිව සඳහන් කරනු ලබන විධිවිධානවලට අනුකූලව මන්ත්‍රීවරයන් එකසිය හතලිස් පස්දෙනෙකු තෝරා පත් කර ගැනීමට වෙන් වෙන් මැතිවරණ කොට්ඨාසවලට එක්ව හිමිකම ඇත්තේ ය.

(2) (1) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව සඳහන් මන්ත්‍රීවරයන් එකසිය හතලිස් පස්දෙනා අතුරෙන් එකී එක් එක් මැතිවරණ කොට්ඨාසය නියෝජනය කිරීම සඳහා උපරිම වශයෙන් මන්ත්‍රීවරයන් විසිපස් දෙනෙකු යුක්තිසහගත සහ සාධාරණ අයුරින් බෙදා වෙන් කිරීම සීමා නිර්ණය කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය :

එසේ වුවද, යටත් පිරිසෙයින් එක් මන්ත්‍රීවරයකු සෑම මැතිවරණ කොට්ඨාසයකට ම බෙදා වෙන් කර දිය යුත්තේ ය.

(3) එසේ බෙදා වෙන් කිරීමක් නොවන්නේ නම් ඌන නියෝජනයක් සිදුවන්නා වූ මැතිවරණ කොට්ඨාස අතර ප්‍රමාණවත් ජනවාර්ගික බැඳියාවන් පිළිබඳ නියෝජනයක් ඇති වීම සහතික කිරීම සඳහා, එකී මැතිවරණ කොට්ඨාස අතර මන්ත්‍රීවරයන් සතර දෙනෙකු සාධාරණාත්මකව බෙදා වෙන් කරනු ලැබිය යුත්තේ ය.

(4) සියලු මැතිවරණ කොට්ඨාසවල ඡන්ද හිමි නාමලේඛණවල නම් දැක්වෙන සමස්ත ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව එකසිය හැටෙන් බෙදිය යුතු ය. එසේ බෙදීමෙන් ලැබෙන සංඛ්‍යාව (ශේෂ වන භාග ගණන් නොගෙන) මේ ව්‍යවස්ථාවේ මින් මතු “පරිමිත සංඛ්‍යාව” යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(5) එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනවල නම් සඳහන් වන්නේ කවර ඡන්ද හිමියන්ගේ ද, එම ඡන්ද හිමියන්ගේ සමස්ත සංඛ්‍යාව

පරිමිත සංඛ්‍යාවෙන් බෙදනු ලැබිය යුතු අතර, එසේ බෙදූ විට ලැබෙන සංඛ්‍යාවට සමාන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් එක් එක් මැතිවරණ කොට්ඨාස නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගැනීමට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයට හිමිකම් ලැබිය යුතු ය. එසේ බෙදා දෙනු ලැබීමෙන් අනතුරුව එම ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාවෙහි යම් ශේෂයක් වේ නම් එම ශේෂය සම්බන්ධයෙන්, අවශ්‍ය නම්, (6) වන අනුව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කළ යුත්තේ ය.

(6) (අ) (5) වන අනුව්‍යවස්ථාවට අනුකූලව පරිමිත සංඛ්‍යාව අනුසාරයෙන් සොයා ගනු ලැබූ සියලු මැතිවරණ කොට්ඨාසවලින් තෝරා පත් කර ගත යුතු සමස්ත මන්ත්‍රීවරයන් සංඛ්‍යාව, (2) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති සංඛ්‍යාවට වඩා අඩු වනු ලබන අවස්ථාවක, එසේ ශේෂ වන මන්ත්‍රී ධුර සංඛ්‍යාව සඳහා ඇති හිමිකම මැතිවරණ කොට්ඨාස අතර බෙදා වෙන් කිරීමේ දී, එසේ බෙදා වෙන් කිරීම (5) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති ඡන්ද හිමි සංඛ්‍යාවේ ශේෂය අනුසාරයෙන් විය යුත්තේ ය.

(ආ) (5) වන අනුව්‍යවස්ථාව යටතේ එක් මන්ත්‍රීවරයකු හෝ තෝරා පත් කර ගැනීමට හිමිකම නොමැති යම් මැතිවරණ කොට්ඨාසයක් සම්බන්ධයෙන් වන විට, එකී බෙදා වෙන් කිරීම එකී මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් සඳහන් වන මුළු ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව මත පදනම් විය යුතු අතර, වැඩිම ඡන්ද හිමියන්ගේ ශේෂයක් හෝ වැඩිම මුළු ඡන්ද හිමි සංඛ්‍යාවක් හෝ සිටින මැතිවරණ කොට්ඨාසයකට එක් වැඩිපුර මන්ත්‍රීවරයකු යනාදී වශයෙන්, තෝරා පත් කර ගත යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකසිය හතලිස් පහක් වන තුරු, මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරාපත් කොට ගැනීමට හිමිකම ඇත්තේ ය.

(7) අවස්ථාවෝචිත පරිදි, (5) වන අනුව්‍යවස්ථාව හෝ (6) වන අනුව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධුර

සංඛ්‍යාව බෙදා වෙන් කිරීමේ දී එම ඡන්ද හිමියන්ගේ ශේෂ දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර නැතහොත් එම ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යා දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර නැතහොත් එම අවස්ථා දෙකේ යම් සංයෝගයක් අතර සමානතාවයක් පවත්නා බව සහ එක් ඡන්ද හිමියකු එකතු කිරීම මගින් යම් මැතිවරණ කොට්ඨාසයකට එක් අතිරේක මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති බව සොයා ගනු ලබන අවස්ථාවක, එවැනි එක් ඡන්ද හිමියකු එකතු කරන ලෙස සලකනු ලැබිය යුත්තේ කවර මැතිවරණ කොට්ඨාසයකට ද යන්න සොයා ගැනීම කුසපත් ඇදීම මගින් නිශ්චය කළ යුත්තේ ය.

සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ එක් එක් මැතිවරණ කොට්ඨාසයට තෝරා පත් කර ගැනීමට හිමිකම් ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කිරීම.

**99.** (1) එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් පාර්ලිමේන්තුවට තෝරා පත් කර යවනු ලැබීමට හිමිකම් ලබන සමස්ත මන්ත්‍රීවරයන් සංඛ්‍යාව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙම ව්‍යවස්ථාවේ ඉක්බිතිව ම සඳහන් කරනු ලබන විධිවිධානවලට අනුව නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(2) 96 වන ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ සහ 98 වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට මන්ත්‍රීවරයන් සංඛ්‍යාව බෙදා වෙන් කිරීමට අමතරව මැතිවරණ කොමිෂන් සභාව විසින්, සමස්ත මැතිවරණ කොට්ඨාස නියෝජනය කිරීම සඳහා මන්ත්‍රීවරයන් දෙසියයක් වූ මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කොට ගත හැකි වන සේ මන්ත්‍රීවරයන් එකසිය හැටක් සමස්ත මැතිවරණ කොට්ඨාස අතර බෙදා වෙන් කරනු ලැබිය යුත්තේ ය.

(3) සියලු මැතිවරණ කොට්ඨාසවල ඡන්ද හිමි නාමලේඛනවල නම් දැක්වෙන සමස්ත ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව එකසිය හැටෙන් බෙදිය යුත්තේ ය. එසේ බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාව

(ශේෂ වන භාග ගණන් නොගෙන) මෙහි මින් මතු "දෙවන පරිමිත සංඛ්‍යාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(4) එක් එක් මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් සඳහන් වන සමස්ත ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව දෙවන පරිමිත සංඛ්‍යාවෙන් බෙදිය යුතු අතර, එසේ බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාවට සමාන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් එම මැතිවරණ කොට්ඨාස නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගැනීමට ඒ එක් එක් මැතිවරණ කොට්ඨාසයට හිමිකම ඇත්තේ ය. තව ද, එසේ බෙදූ විට එම ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාවෙහි යම් ශේෂයක් වේ නම්, ඒ ශේෂය සම්බන්ධයෙන්, අවශ්‍ය නම්, (5) වන අනුව්‍යවස්ථාවට අනුකූලව ක්‍රියා කළ යුත්තේ ය.

(5) දෙවන පරිමිත සංඛ්‍යාව අනුසාරයෙන් (4) වන අනුව්‍යවස්ථාවට අනුකූලව නිශ්චය කරන ලද මැතිවරණ කොට්ඨාස සියල්ලෙන්ම තෝරා පත් කර ගත යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකසිය හැටකට වඩා අඩු වන අවස්ථාවක, ඉතිරි මන්ත්‍රී ධූර සංඛ්‍යාව සඳහා වූ හිමිකම මැතිවරණ කොට්ඨාස අතර බෙදා වෙන් කිරීම (4) වන අනුව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාවේ ශේෂය අනුසාරයෙන් විය යුත්තේ ය. (4) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද නිශ්චය කිරීම අනුව යම් මැතිවරණ කොට්ඨාසයක් එකම මන්ත්‍රීවරයකු හෝ තෝරා පත් කර ගැනීමට හිමිකම් නොලබන අවස්ථාවක, එසේ බෙදා වෙන් කිරීම ඒ මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද හිමි නාමලේඛනයේ නම් ඇතුළත් වන සමස්ත ඡන්ද හිමියන්ගේ සංඛ්‍යාව පදනම් කොට ගෙන කළ යුතු අතර, ඒ අනුව වැඩිම ඡන්ද හිමියන්ගේ ශේෂයක් හෝ වැඩිම මුළු ඡන්ද හිමි සංඛ්‍යාවක් හෝ සිටින මැතිවරණ කොට්ඨාසයට එක් වැඩිපුර මන්ත්‍රීවරයෙකු යනා දී වශයෙන්, තෝරා පත් කර ගත යුතු මුළු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකසිය හැටක් වන තුරු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීමට හිමිකම ඇත්තේ ය.

(6) (4) වන අනුව්‍යවස්ථාව හෝ (5) වන අනුව්‍යවස්ථාව යටතේ මන්ත්‍රී ධුර බෙදා වෙන් කරනු ලබන අවස්ථාවේ දී, එම ඡන්ද හිමියන්ගේ ශේෂ දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර නැතහොත් එම ඡන්ද හිමියන්ගේ මුළු සංඛ්‍යා දෙකක් හෝ වැඩි ගණනක් අතර නැතහොත් එම අවස්ථා දෙකේ යම් සංයෝගයක් අතර සමානතාවයක් පවත්නා බව සහ එක් ඡන්ද හිමියකු එකතු කිරීම මගින් එක් මැතිවරණ කොට්ඨාසයකට අතිරේක මන්ත්‍රීවරයෙකු තෝරා පත් කර ගැනීමට හිමිකම ඇති බව සොයා ගනු ලබන අවස්ථාවක, එසේ එක් ඡන්ද හිමියකු එකතු කරන ලෙස සලකනු ලැබිය යුත්තේ කවර මැතිවරණ කොට්ඨාසයකට ද යන්න සොයා ගැනීම කුසපත් ඇදීම මගින් තීරණය කළ යුත්තේ ය.

(7) ඡන්ද හිමි නාමලේඛනයේ නම සඳහන් වන යම් ඡන්ද හිමියකු, එම ඡන්ද හිමියාගේ නම මැතිවරණ කොට්ඨාස හෝ ඡන්ද ප්‍රදේශ එකකට වඩා වැඩි ගණනක ඡන්ද හිමි නාමලේඛනවල සඳහන් වුව ද, එය නොතකා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම සඳහා පවත්වනු ලබන යම් මැතිවරණයක දී එක් ඡන්දයක් ලකුණු කිරීම සඳහා පමණක් හිමිකම් ලැබිය යුත්තේ ය.

(8) සියලු මැතිවරණ කොට්ඨාස සඳහා ඡන්ද හිමි නාමලේඛන සහතික කළ පසු හැකිතාක් ඉක්මණින්, 97 වන ව්‍යවස්ථාව යටතේ වූ ප්‍රකාශනය ප්‍රකාර සහ මේ ව්‍යවස්ථාව ප්‍රකාර එක් එක් මැතිවරණ කොට්ඨාසයකින් සහ ඒ මැතිවරණ කොට්ඨාසය තුළ ඇති එක් එක් ඡන්ද ප්‍රදේශයකින් තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම ලබන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව මැතිවරණ කොමසාරිස්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් සහතික කළ යුත්තේ ය.

(9) "ඡන්ද හිමි නාමලේඛනය" යන්නෙන්, යම්කිසි මැතිවරණයක් පවත්වනු ලබන්නේ තත්කාලයේ බලපවත්නා යම් ඡන්ද හිමි නාමලේඛනයක් පදනම්

කරගෙන ද, ඒ ඡන්ද හිමි නාමලේඛනය අදහස් වේ.

ඡන්ද ප්‍රදේශ නියෝජනය කිරීම සඳහා මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම.

99අ. (1) (අ) පිළිගත් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන අපේක්ෂකයන් ලෙස තරග කරනු ලබන තැනැත්තන්ගෙන් යුත් (මෙහි මින් මතු "ස්වාධීන කණ්ඩායමක්" යනුවෙන් හඳුන්වනු ලබන) කණ්ඩායමක් හෝ විසින් 98 වන ව්‍යවස්ථාවේ නිශ්චිතව දක්වා ඇති මන්ත්‍රීවරයන් සංඛ්‍යාව තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා එකී පක්ෂය හෝ කණ්ඩායම විසින් තරග කිරීමට අපේක්ෂා කරනු ලබන මැතිවරණ කොට්ඨාසය සම්බන්ධයෙන් -

(i) එක් එක් ඡන්ද ප්‍රදේශය සඳහා නම් කරනු ලැබූ, අවස්ථාවෝචිත පරිදි එක් එක් අපේක්ෂකයාගේ හෝ අපේක්ෂකයන්ගේ නම් ද;

(ii) යම් මැතිවරණ කොට්ඨාසයක් සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු සමස්ත මන්ත්‍රීවරයන් සංඛ්‍යාවේ සහ එකී මැතිවරණ කොට්ඨාසය ඇතුළත වූ ඡන්ද ප්‍රදේශවලින් ඍජුව තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම ඇති සමස්ත මන්ත්‍රීවරයන් සංඛ්‍යාවේ වෙනසට තුනක් එකතු කිරීමෙන් සෑදුනු සංඛ්‍යාවට සමාන වූ අමතර අපේක්ෂකයන්ගේ නම් ද,

සඳහන් කරමින් එක් නාම යෝජනා පත්‍රයක් ඉදිරිපත් කළ යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන් ව ඇත ද, සමස්ත අපේක්ෂකයන් සංඛ්‍යාවෙන් සියයට දහයකට නොඅඩු සංඛ්‍යාවක් (ශේෂ වන භාග සැලකිල්ලට නොගෙන) හෝ කෙසේ වුව ද (1) (අ) අනුව්‍යවස්ථාව යටතේ ඉදිරිපත් කරන ලද එක් එක් නාමයෝජනා පත්‍රයේ සඳහන් අපේක්ෂකයන්ගෙන් අවම වශයෙන් එක් අපේක්ෂකයකු, අවස්ථාවෝචිත පරිදි කාන්තාවන්ගෙන් හෝ කාන්තාවකගෙන් සමන්විත විය යුත්තේ ය.

(2) (අ) පාර්ලිමේන්තු මැතිවරණයක දී එක් මන්ත්‍රීවරයෙකු තෝරා පත් කර ගැනීම සඳහා හිමිකම් ලබන ඡන්ද ප්‍රදේශයක් සම්බන්ධයෙන්, ඒ එක් එක් ඡන්ද ප්‍රදේශයේ දී ලබා දී ඇති වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන ඇත්තේ කවර අපේක්ෂකයකු ද, එම අපේක්ෂකයා පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගෙන ඇති බවට, අවස්ථාවෝචිත පරිදි, මැතිවරණ කොමසාරිස්වරයා හෝ තේරීම් භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කළ යුත්තේ ය.

(ආ) එක් මන්ත්‍රීවරයෙකුට වඩා වැඩි මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කර ගැනීමට හිමිකම් ලබන ඡන්ද ප්‍රදේශයක් සම්බන්ධයෙන්, ඒ එක් එක් ඡන්ද ප්‍රදේශයේ දී ලබා දී ඇති වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් අවස්ථාවෝචිත පරිදි, දෙවනුව වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන ඇති අපේක්ෂකයා හෝ දෙවනුව සහ තෙවනුව වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන ඇති අපේක්ෂකයන් පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගෙන ඇති බවට, අවස්ථාවෝචිත පරිදි, මැතිවරණ කොමසාරිස්වරයා හෝ තේරීම්භාර නිලධරයා විසින් ප්‍රකාශයට පත් කළ යුත්තේ ය.

(ඇ) යම් ඡන්ද ප්‍රදේශයක් සම්බන්ධයෙන් වන විට, අපේක්ෂකයන් සමාන ඡන්ද සංඛ්‍යාවක් ලබාගෙන ඇති අවස්ථාවක සහ එක් ඡන්දයක් එකතු කිරීම මගින් අවස්ථාවෝචිත පරිදි අපේක්ෂකයකු හෝ අපේක්ෂකයන් තෝරා පත් කර ගැනීමට හැකි වේ නම්, අවස්ථාවෝචිත පරිදි, මැතිවරණ කොමසාරිස්වරයා හෝ තේරීම්භාර නිලධරයා විසින් එම ඡන්දය හෝ ඡන්ද එකතු කළ යුත්තේ අවස්ථාවෝචිත පරිදි, කවර අපේක්ෂකයාට ද හෝ අපේක්ෂකයන්ට ද යන්න කුසපත් ඇදීම මගින් නිශ්චය කළ යුත්තේ ය.

**මහා මැතිවරණයක දී දෙන ලද මුළු ඡන්ද සංඛ්‍යාව පදනම් කරගෙන සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීම.**

99ආ. (1) එක් එක් මැතිවරණ කොට්ඨාසයෙන් තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාව මෙම ව්‍යවස්ථාවේ ඉක්බිතිව සඳහන් කරනු ලබන විධිවිධානවලට අනුකූලව නිශ්චය කළ යුත්තේ ය.

(2) (අ) යම් මැතිවරණයක දී යම් මැතිවරණ කොට්ඨාසයක දෙන ලද සමස්ත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට තුනකට වඩා අඩු ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් සෑම පිළිගත් දේශපාලන පක්ෂයක් සහ ස්වාධීන කණ්ඩායමක් ම, යම් ඡන්ද ප්‍රදේශයකින් සෘජුව මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීමෙන් හැර, එම මැතිවරණ කොට්ඨාසය සඳහා එම පක්ෂයෙන් හෝ කණ්ඩායමෙන් මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීමට සුදුසුකම් නොලැබිය යුත්තේ ය.

(ආ) ඉහත (2) (අ) අනුව්‍යවස්ථාව අනුව එම මැතිවරණ කොට්ඨාසය සඳහා මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීමට සුදුසුකම් නොලැබූ යම් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් වේ නම්, එවිට, එම මැතිවරණයේ දී එම මැතිවරණ කොට්ඨාසයේ දෙන ලද සමස්ත වලංගු ඡන්ද සංඛ්‍යාවෙන් එම පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ලබා ගන්නා ලද මුළු ඡන්ද සංඛ්‍යාව අඩු කළ යුතු අතර, එසේ අඩු කිරීමෙන් ලැබෙන ඡන්ද සංඛ්‍යාව මේ ව්‍යවස්ථාවේ මින් මතු "අදාළ ඡන්ද සංඛ්‍යාව" ලෙස හඳුන්වනු ලැබේ.

(ඇ) අදාළ ඡන්ද සංඛ්‍යාව එම මැතිවරණ කොට්ඨාසය සඳහා තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් බෙදනු ලැබිය යුත්තේ ය. එකී බෙදීමේ ප්‍රතිඵලය ලෙස ලැබෙන සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් වන්නේ නම්, එම පූර්ණ සංඛ්‍යාව හෝ එම සංඛ්‍යාව පූර්ණ සංඛ්‍යාවක් සහ භාගයක් වන්නේ නම්, එම පූර්ණ සංඛ්‍යාවට සහ භාගයට ඉක්බිතිව ම වූ ඉහළ පූර්ණ සංඛ්‍යාව මෙහි මින් මතු "සම්ප්‍රයුක්ත සංඛ්‍යාව" වශයෙන් හඳුන්වනු ලැබේ.

(3) (2) (අ) අනුව්‍යවස්ථාව යටතේ නුසුදුසු වූ පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් හැර එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය සහ ස්වාධීන කණ්ඩායම විසින් ලබාගන්නා ලද ඡන්ද සංඛ්‍යාව, වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායමෙන් ආරම්භ කරමින්, සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදිය යුත්තේ ය. තේරීම් භාර නිලධරයා විසින්, එකී එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ලබාගත් ඡන්ද සංඛ්‍යාව සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන් බෙදීමෙන් අනතුරුව ලැබෙන සංඛ්‍යාවට සමාන මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් තෝරා පත් කර යැවීමට එම පක්ෂයට හෝ කණ්ඩායමට හිමිකම් ලැබිය යුතු බව ප්‍රකාශයට පත් කළ යුත්තේ ය :

එසේ වුව ද, එකී බෙදීමෙන් ලැබෙන පූර්ණ සංඛ්‍යාව (ශේෂවන භාග ගණන් නොගෙන) ගණන් ගත යුතු වන්නේ ය :

එසේ ම තවදුරටත්, එම මැතිවරණ කොට්ඨාසයේ වැඩිම ඡන්ද සංඛ්‍යාවක් ලබාගත් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ඉහත සඳහන් සම්ප්‍රයුක්ත සංඛ්‍යාව අනුසාරයෙන් වෙන් කරනු ලබන මන්ත්‍රී ධුර සංඛ්‍යාවට අමතරව එක් මන්ත්‍රී ධුරයක් හිමිවන්නේ ය.

(4) (අ) (3) වන අනුව්‍යවස්ථාව යටතේ සම්ප්‍රයුක්ත සංඛ්‍යාවට අනුව යම් නිශ්චිත මැතිවරණ කොට්ඨාසයක් නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගත් මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව, සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට වඩා අඩු වන අවස්ථාවක, එම මැතිවරණයේ දී තරග කරන ලද ඒ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හිමිකම් ලබන ඉතිරි මන්ත්‍රීවරයන් සංඛ්‍යාව, ඒ ඒ දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම ලබා ගත් ඡන්ද සංඛ්‍යාව සම්ප්‍රයුක්ත සංඛ්‍යාවෙන්

බෙදීමෙන් ශේෂ වන ඡන්ද සංඛ්‍යාව හෝ (3) වන අනුව්‍යවස්ථාවට අනුකූලව මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගැනීමට හිමිකම් ඇති එහෙත් කිසිම මන්ත්‍රීවරයකු තේරී පත් නොවූ පිළිගත් දේශපාලන පක්ෂ සහ ස්වාධීන කණ්ඩායම් ලබා ගත් ඡන්ද සංඛ්‍යාව හෝ මත පදනම්ව නිශ්චය කරනු ලැබිය යුත්තේ ය.

(ආ) සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ එම මැතිවරණ කොට්ඨාසයට තෝරා පත් කර ගනු ලබන සමස්ත මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සම්පූර්ණ වන තෙක්, වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායමට (අ) ඡේදයේ සඳහන් පදනම මත එක් අතිරේක මන්ත්‍රීවරයකු බැගින් ලබා දිය යුත්තේ ය.

(5) (3) වන හෝ (4) වන අනුව්‍යවස්ථා යටතේ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කිරීමේ දී එම මැතිවරණ කොට්ඨාසයේ ඡන්ද සංඛ්‍යාවේ ශේෂ දෙකක් හෝ ඊට වැඩි ගණනක් හා අතර නැතහොත් එම ඡන්දවල මුළු සංඛ්‍යා දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර නැතහොත් එම අවස්ථා දෙකේ යම් සංයෝගයක් අතර සමානතාවයක් පවත්නා බව සහ එක් ඡන්දයක් හෝ ඊට වැඩි ඡන්ද සංඛ්‍යාවක් එකතු කිරීම මගින් එක් අතිරේක මන්ත්‍රීවරයකු තෝරා පත් කර ගැනීමට එකී පක්ෂයට හෝ කණ්ඩායමට හිමිකමක් ඇති බව සොයා ගනු ලබන අවස්ථාවක, එසේ එක් ඡන්ද හිමියකු එකතු කරන ලෙස සලකනු ලැබිය යුත්තේ කවර පක්ෂයට ද නැතහොත් කණ්ඩායමට ද යන්න තීරණය කිරීම කුසපත් ඇදීම මගින් නිශ්චය කළ යුත්තේ ය.

(6) එම මැතිවරණයේදී තරඟ කරන ලද එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා පත් කර ගනු ලැබීමට හිමිකම ඇති මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාව (2) වන අනුව්‍යවස්ථාව යටතේ සම්ප්‍රයුක්ත සංඛ්‍යාවට අනුකූලව යම් නිශ්චිත මැතිවරණ කොට්ඨාසයක් නියෝජනය කිරීම සඳහා තෝරා පත්

කර ගැනීමට හිමිකම ඇති මන්ත්‍රීවරයන්ගේ සංඛ්‍යාවට, වඩා අඩු හෝ වැඩි වන අවස්ථාවක දී එසේ අඩු හෝ වැඩි වන මන්ත්‍රීවරයන් සංඛ්‍යාව මෙම ව්‍යවස්ථාවේ ඉක්බිතිව සඳහන් කරනු ලබන විධිවිධානවලට අනුකූලව සම්පූර්ණ කළ යුත්තේ ය.

(7) (2) වන අනුව්‍යවස්ථාව යටතේ සම්ප්‍රයුක්ත සංඛ්‍යාවට අනුකූලව යම් විශේෂිත මැතිවරණ කොට්ඨාසයක් ඇතුළත ඡන්ද ප්‍රදේශ නියෝජනය කිරීම සඳහා තෝරා පත් කරගනු ලැබූ පිළිගත් දේශපාලන පක්ෂයක හෝ ස්වාධීන කණ්ඩායමක මන්ත්‍රීවරයන් සංඛ්‍යාව සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට වඩා අඩු වන අවස්ථාවක, එම මැතිවරණයේ දී තරග කරන ලද එහෙත් තෝරා පත්වනු නොලැබූ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හිමිකම් ලබන ඉතිරි මන්ත්‍රීවරයන් සංඛ්‍යාව නිශ්චය කිරීම, ඒ ඒ ඡන්ද ප්‍රදේශය සඳහා එම පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායමෙන් තරග කරන ලද නමුත් තේරී පත් නොවූ අපේක්ෂකයන් අදාළ ඡන්ද ප්‍රදේශවල දී ලබාගත් ඡන්ද සංඛ්‍යාවේ (එම ඡන්ද ප්‍රදේශයේ වලංගු ඡන්ද සංඛ්‍යාව අනුසාරයෙන්) ප්‍රතිශතය මත පදනම් විය යුතු ය. තව ද මන්ත්‍රීවරයන් තෝරා පත් කර ගනු ලැබීමේ දී වැඩිම ප්‍රතිශතය ලබාගත් අපේක්ෂකයාගෙන් ආරම්භ කොට සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ එම පිළිගත් දේශපාලන පක්ෂයෙන් හෝ ස්වාධීන කණ්ඩායමෙන් පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා හිමිකම් ලබන සමස්ත මන්ත්‍රී ධුර සංඛ්‍යාව සම්පූර්ණ වන තෙක් අවරෝහන පිළිවෙලට තෝරා පත් කර ගත යුත්තේ ය :

එසේ වුව ද, තෝරා පත් කර ගනු නොලැබුවා වූ ද හෝ එහෙත් මේ අනුව්‍යවස්ථාව යටතේ දෙන ලද ඡන්ද සංඛ්‍යාවෙන් වැඩිම වලංගු ඡන්ද සංඛ්‍යාව ලබා ගන්නා වූ ද අපේක්ෂකයන් අතුරෙන් මේ

අනුව්‍යවස්ථාව යටතේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවෙන් අඩකට වැඩි නොවන සංඛ්‍යාවක්, නම් කිරීමට පිළිගත් දේශපාලන පක්ෂයක ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමක නායකයාට හිමිකම තිබිය යුතු අතර සමානුපාතික නියෝජන ක්‍රමය ප්‍රකාරව එකී පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට එක් අමතර මන්ත්‍රීවරයකු පමණක් සඳහා හිමිකම ඇති අවස්ථාවක, එකී පිළිගත් දේශපාලන පක්ෂ ලේකම්වරයා හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයා හෝ වැඩිම ඡන්ද ප්‍රතිශතයක් ලැබ තේරී පත් වූ මන්ත්‍රීවරයා වෙනුවට එකී ඡන්ද ප්‍රදේශයෙන් තරඟ කොට තේරී පත් නොවූ සුදුසු අපේක්ෂකයකු නම් කරනු ලැබිය හැක්කේ ය.

(8) (2) වන අනුව්‍යවස්ථාව යටතේ සම්ප්‍රයුක්ත සංඛ්‍යාවට අනුව යම් විශේෂිත මැතිවරණ කොට්ඨාසයක ඡන්ද ප්‍රදේශ නියෝජනය කිරීම සඳහා යම් පිළිගත් දේශපාලන පක්ෂයකින් හෝ ස්වාධීන කණ්ඩායමකින් තෝරා පත් කර ගනු ලැබූ මන්ත්‍රීවරයන් සංඛ්‍යාව එකී දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා පත් කර ගනු ලැබිය යුතු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට වඩා වැඩිවන අවස්ථාවක, ඒ එක් එක් පිළිගත් දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට ඉතිරි මන්ත්‍රීවරයන් සංඛ්‍යාවට ඇති හිමිකම නිශ්චය කිරීම සඳහා 99 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ සඳහන් මන්ත්‍රීවරයන් දෙසීය, 62 වන ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවට තෝරා පත් කර ගත යුතු මන්ත්‍රීවරයන් මුළු සංඛ්‍යාව වන මන්ත්‍රීවරුන් දෙසිය තිස් හතෙන් අඩුකිරීමෙන් ලැබෙන මන්ත්‍රී ධුර සංඛ්‍යාවෙන් වෙන් කර දිය යුත්තේ ය.

(9) පාර්ලිමේන්තු මහා මැතිවරණයක දී 99 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ සඳහන් මන්ත්‍රීවරයන් දෙසීය දෙනා තෝරා පත් කර ගනු ලැබූ ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීමෙන්

අනතුරුව ඡන්ද දායකයින් විසින් දෙන ලද සමස්ත වලංගු ඡන්ද සංඛ්‍යාව අනුසාරයෙන් එක් එක් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් විසින් ලබා ගත් සමස්ත වලංගු ඡන්ද සංඛ්‍යාව පදනම් කර ගනිමින්, මූලිකව බෙදා වෙන් කළ යුතු ඉතිරි මන්ත්‍රී ධුර සංඛ්‍යාව ජාතික ලැයිස්තුවෙහි වූ මන්ත්‍රී ධුර තිස් හතෙන් එකී මහ මැතිවරණයට තරග කළ පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් අතර මැතිවරණ කොමසාරිස් විසින් වහාම බෙදා වෙන් කිරීම සිදු කළ යුත්තේ ය. එක් එක් පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම ලබා ගත් මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ජාතික ලැයිස්තුව මගින් එකී පක්ෂයට හෝ කණ්ඩායමට බෙදා වෙන් කර දුන් මන්ත්‍රීවරයන් සංඛ්‍යාව ඉක්මවන අවස්ථාවක දී එකී අතිරික්ත සංඛ්‍යාව, පළමුව ජාතික ලැයිස්තුවෙන් අඩු කළ යුතු අතර, ශේෂය අදාළ පක්ෂ හෝ කණ්ඩායම් ලබා ගත් වලංගු ඡන්ද සංඛ්‍යාවේ ප්‍රතිශතයට අනුව බෙදා වෙන් කර දිය යුත්තේ ය. එසේ බෙදා වෙන් කිරීමේ කාර්යය සඳහා (2) සිට (8) දක්වා වූ අනුව්‍යවස්ථාවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුත්තේ ය.

(10) ඡන්ද ප්‍රදේශයක් නියෝජනය කිරීම සඳහා තෝරා පත් කර ගත් මන්ත්‍රීවරයෙකු ඉල්ලා අස්වීම නිසා හෝ නෙරපීම නිසා හෝ එම මන්ත්‍රීවරයාගේ පක්ෂ සාමාජිකත්වය අවසන් කිරීම නිසා හෝ එම මන්ත්‍රීවරයා මියයාම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් ඡන්ද ප්‍රදේශයක පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, එම ඡන්ද ප්‍රදේශය සඳහා අතුරු මැතිවරණයක් පැවැත්වීමට මැතිවරණ කොමසාරිස්වරයා විසින් කටයුතු සැලැස්විය යුතු ය. සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ තෝරා පත් කර ගනු ලැබූ මන්ත්‍රීවරයෙකු සම්බන්ධයෙන් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක, එම නිශ්චිත ඡන්ද ප්‍රදේශය සඳහා, මැතිවරණයේ දී තරග කළ අපේක්ෂකයන් අතරින් හෝ එම මැතිවරණය සඳහා නාමයෝජනා කරන ලද එහෙත් ඡන්ද ප්‍රදේශය සඳහා තරග නොකළ අමතර අපේක්ෂකයන් අතරින් අදාළ

පුරප්පාඩුව සඳහා මන්ත්‍රීවරයෙකු නම් කිරීමට දේශපාලන පක්ෂ ලේකම්වරයාට හෝ ස්වාධීන කණ්ඩායමේ නායකයාට බලය ඇත්තේ යඃ

එසේ වුව ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නෙරපනු ලැබූ අවස්ථාවක ඔහු විසින් ලියවිල්ලකින් වූ පෙත්සමක් මඟින්, එසේ නෙරපීමේ දින සිට එක් මසක කාලසීමාවක් ඉකුත්වීමට පෙර ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉල්ලීමක් කර ඇති අවස්ථාවක සහ එම ඉල්ලීම ලැබීමෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එකී නෙරපීම වලංගු නොවන බවට තීරණය කර ඇති විට ඔහුගේ අසුන පුරප්පාඩු නොවිය යුතු අතර එම පෙත්සම ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරුන් තිදෙනෙකු විසින් විභාග කළ යුතු අතර එම පෙත්සම ගොනු කිරීමෙන් මාස දෙකක කාලයක් ඇතුළත ඒ පිළිබඳව තීරණය කළ යුතු ය. එකී නෙරපීම වලංගු බවට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කරනු ලැබූ අවස්ථාවක දී එම තීරණයේ දින සිට එම පුරප්පාඩුව පවතින්නේ ය ඃ

එසේම තවදුරටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන්නා වූ මන්ත්‍රීවරයාට එහෙව පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම විසින් ගනු ලැබූ හෝ ගැනීමට යෝජිත විනය ක්‍රියාමාර්ගයකට අදාළ වූ කවර හෝ කාරණයක් සම්බන්ධයෙන් කිසිදු අධිකරණයකට අධිකරණ බලයක් නොතිබිය යුතු අතර ඒ අනුව එකී ක්‍රියාමාර්ගය හෝ යෝජිත ක්‍රියා මාර්ගය වළක්වමින්, සීමාකරමින් හෝ තහනම් කරමින් යම් රිට් ආඥාවක්, ඉන්ජක්ෂන් තහනමක් හෝ නිවැරුම් ආඥාවක් කිරීමට කිසිදු අධිකරණයකට බලයක් නොතිබිය යුත්තේ ය. මේ ව්‍යවස්ථාව යටතේ පැන නැගිය හැකි යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට ශ්‍රේෂ්ඨාධිකරණයට අනන්‍ය අධිකරණ බලය ඇත්තේ ය.

**7.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුත්තේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.